# චුති චිත්තය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සූත්‍රාගත අධ්‍යයනයක්

**ආචාර්ය පූජ්‍ය පනාමුරේ චන්දිම හිමි**
කථිකාචාර්ය
බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
chandimapanamure@gmail.com

බෞද්ධ දර්ශනය තුළ සාකච්ඡා කෙරෙන ප්‍රධාන මාතෘකාවක් වන්නේ චුති චිත්තයයි. එනම් යමෙක් මරණාසන්න අවස්ථාවේ ඔහු හෝ ඇයගේ සිත තුළ පහළ වන සිතුවිල්ලයි. එම සිතුවිල්ලට අනුව ඊළග භවය හට ගන්නා බව පැවසෙයි. යම් යම් සූත්‍රයන් තුළ පමණක් නොව විවිධ කතා වස්තුවලින් ද ඒ බව සනාථ වෙයි. චුති චිත්තයට අනුව පරලොව ජීවිතය සකස්වන බව කියැවෙන සූත්‍රයක් වන්නේ මජ්ඣිම නිකායේ මහා කම්ම විභංග සූත්‍රයයි. එහි කියැවෙන ආකාරයට මියයන අය උපත ලබන ආකාර හතරක් දක්වා ඇත. එනම්, පින්කරන අය දෙව්ලොව උපදී, පින්කරන අය අපායෙහි උපදී, පව්කරන අය අපායෙහි උපදී, පව්කරන අය දෙව්ලොව උපදී. මෙම සූත්‍රයෙන් පැහැදිලි වන ආකාරයට පින් හෝ පව් කළ අය එය සාධකයක් කර නොගෙන පරලොව ජීවිත සකස්වන ආකාරය පෙන්වා දී ඇත. ඒ අනුව පරලොව ජීවිතය සඳහා මූලික වශයෙන් බලපාන්නේ චුති චිත්තයයි. එනම් මරණාසන්න මොහොතේ පහළ වන සිතයි. බුදුන් දවස සිටි කෝසල මල්ලිකාගේ කතාපුවත මීට කදිම නිදසුනකි. ඇය ශ්‍රද්ධා සම්පන්න වුවත් මරණාසන්න අවස්ථාවේ ඇති වූ සිතුවිල්ල නිසා තිරිසන් යෝනියේ පිඹුරෙක් වී ඉපිද සිටි බව කියැවේ. තවද බුද්ධ කාලයේ වැඩසිටි තිස්ස නම් භික්ෂුවක් චිත්ත ආශ්‍රවයන් හේතු කොටගෙන වස්ත්‍ර සිවුරුවලට ආශාවෙන් මියගොස් එම සිවුරු මත උකුණෙකු වී ඉපිද ඇත. මෙහි දි අනෙක් භික්ෂූන් බුදුන් වහන්සේ වෙත ගොස් මියගිය භික්ෂුවගේ සිවුරු අනෙක් භික්ෂූන්ට බෙදා දීමට උත්සාහ කිරීමේ දී දින හතක් යන තුරු එය නොකරන ලෙස උපදෙස් ලබා දුන්හ. එයට හේතුව ලෙස බුදුන් වහන්සේ දන්වා සිටින්නේ එම භික්ෂුව මියගොස් ඒ සිවුරුවල උකණෙකු වී උපත ලබා ඇති නිසා එම සිවුරු තව කෙනෙකුට දුන් විට එම උකුණා කෝප වී මිය ගොස් දුගතියේ උපත ලබන බවයි. ඒ අනුව චුති චිත්තය පුද්ගලයාගේ පරලොව ජීවිතය තීරණය කරන බව පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පදඃ** චුති සිත, බෞද්ධ දර්ශනය, සූත්‍ර, මරණය, උපත